මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

රසික සිත් පුබුදන නර්තනය

මෙල්බන් නුවර ප්‍රසාංගික වේදිකාවේ නැටුම් රංගනයක් තිබුණොත් අනිවාර්යයෙන්ම කියැ-වෙන නමක් තියෙනවා. ඒ රසිකා කුලසිංහ නර්තන කන්ඩායම යි. මෑතකදී රංග ගත වූ මහාසාර නාටකයේ යම් යම් නැටුම් අංග නිර්මාණය කළේ ද රසිකා ය. එමෙන්ම කුමන සන්දර්ශණයකට වුවත් ඇගේ ආධාරය ලැබන බව අපි හැමෝම දන්නවා. මම රසිකා හමුවෙන්නට ඇගේ නිවහනට ගියා. ඇතදීම මට බෙර ශබ්දය ඇසුණා. ඔස්ට්‍රේලියාවේ මෙවැනි බෙර හඬක් ඇසීම පවා ඇති කරන්නෙ සතුටක්. මම රසිකා ගේ නිවසට ගොඩ වැදුනා. ඇ ළමුන් කණ්ඩායමක් සමග නර්තන පුහුණුවක. එය අවසන් කරන තෙක් සිටි මම ඇ සමග සන්නස වෙනුවෙන් පිළිසඳරකට එක්වුණා.

ශ්‍රීනාත්
රසිකා... නිවාඩු කාලෙත් ළමයින් එක්ක බරටම වැඩ වගේ... මොනවද කරන්නෙ...?

රසිකා
ආයුබෝවන් ශ්‍රීනාත්... අපේ නැටුම් පුහුණුවෙන තැනට ආවට බොහොම ස්තුතියි... අපි මේ ලැස්ති වෙන්නෙ 2007 මාර්තු 4 වනදා පැවැත්වෙන විශ්ව නර්තන බ ො ප්‍රසංගය පුහුණු වෙන්න... නිවාඩු කාලෙ ළමයි විවේකයෙන්නෙ ගෙදරට වෙලා ඉන්නෙ... මම ඒ අවස්ථාව යොදා ගත්තා ළමයින්ටත් වැදගත් වෙන වැඩක් කරන්න... ඒකයි මේ වෙලාවෙ නැටුම් පුහුණු වෙන්නෙ...

ශ්‍රීනාත්
මේ ප්‍රසංගය ගිය අවුරුද්දෙත් පැවැත්තුවද...?
රසිකා
නෑ ශ්‍රීනාත්... 2005 තමයි අන්තිම වරට පැවැත්තුවෙ...

ශ්‍රීනාත්
මොකක්ද මේකෙ අරමුණ...
රසිකා
මේකෙ අරමුණ තමයි ළමයින්ගෙ දක්ෂතා ඉදිරිපත් කිරීම... ඔස්ට්‍රේපියාවෙ පීවත් වන ශ්‍රී ලාංකික ළමයි හැම දේටම ඉතාමත්ම දක්ෂයි... ඉතින් අනිත් හැම දක්ෂතාවන්ම පෙන්නන්න අවස්තාව තියෙනවා... මේ වගේ දක්ෂතා පෙන්නන්න අවස්ථා අඩුයි... ඒකයි මේ ප්‍රසංගය ඉදිරිපත් කරන්නෙ... ඒ වගේම ළමුන්ගෙ දෙමාපියන් දෙන්නෙත් ලොකු සහයෝගයක්... ඒ ගැන හරිම ආඩම්බරයි. මං ඒක අගය කරනවා...

ශ්‍රීනාත්
විශ්ව නර්තන රේඛා ප්‍රසංගයට ඇතුලත් වෙන්නෙ මොන වගේ අංග ද...?
රසිකා
උඩරට පහතරට ගැමි ශාස්ත්‍රිය භරත උතුරු ඉන්දියානු නැටුම් සහ නව නිර්මාණ

ශ්‍රීනාත්
විශාල ප්‍රසංගයක් වගේ... මේ සියල්ලම ඇතුලත් වෙනවා එහෙනම්...
රසිකා

ශ්‍රීනාත්
ඔබ නැටුම් කාලවට පැමිනුණේ කොහොමද?
රසිකා
මම ගියේ ගලහිටියාව මධ්‍ය මහා විධ්‍යාලයට... මම එහෙදි නැටුම් ඉගෙන ගත්තා... උසස්පෙළ කරන අතරදි ගාන්ධර්ව පූර්ව මධ්‍යම අවසන් කළා... මම අපොස උසස් පෙළ ට නැටුම් හා නාට්‍ය කරණය කළ... ඉන් පස්සෙ කැළණි විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ නැටුම් උපාධිය හැදෑරුවා... විශ්ව විධ්‍යාලයේ ඉන්න කාලෙදි බෙර හා පහතරට ගාන්ධර්ව ප්‍රාරම්භ මධ්‍යම අවසන් කළා... රජිනි සෙල්වනායගම් මහත්මියගෙන් භරත නැටුම් ඉගෙන ගත්තා...

ශ්‍රීනාත්
ගුරුවරියක් හැටියටත් වැඩ කළා නේද?
රසිකා
ඔව්... මම මුලින්ම තනමල්විල මහා විද්‍යාලයේ ගුරුවරියක් හැටියට සේවය කලා... මේ පාසලේ නැටුම් වලින් කැපී පෙනෙන වෙනසක් කරන්න මට පුලුවන් වුනා... මම පෙරදිග තූර්යවාදක කන්ඩායමක් ඇති කලා... අපොස සාපෙළ නැටුම් විෂයට ඉදිරිපත් කළ ළමයි විශිෂ්ඨ සම්මාන ලබා ගත්තා... ඒ ගැන මම අදටත් සතුටු වෙනවා... ඉන් පස්සෙ මම මිලාගිරියේ ශාන්ත පාවුලු බාලිකා විද්‍යාලයේ සේවය කළා... ඒකෙදිත් මම යම් යම් තරග වලට ළමයි ඉදිරිපත් කළා...

ශ්‍රීනාත්
ඔස්ට්‍රේලියාවට ආවෙ...
රසිකා
2000 දි... එතනින් ගුරු වෘත්තියට ආයුබෝවන් කිව්වා... 2002 දි මම නැටුම් ශිල්පායතනය ආරම්භ කළා... දැනට ළමුල් 150 ක් පමණ මා

බාල වර්ගය

සොම්නස වැඩෙන දෙයක්ම කළ යුතුය.

රජගහනුවර වේළුවනාරාමය

තංච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතිතෝ සුමනෝ
විපාකං පටිසේවති.

සිනා පිරුණු මුහුණින් යුතුව විඳිමට
සිතේ සතුටටම හේතුවන
සොම්නසම වඩන දේ
කිරීම නම් යහපත් ය.

Tan ca Kmmam Katam Sadhu
Yam katva nanutappati
Yassa Patito sumano
vipakam patisevati

That deed is well done when
after having done it,one repents not,
and when, with joy and pleasure,
one reaps the fruit thereof.

සුමන නම් මල් කරු ඇරැඹ,

රජගහනුවර සුමන නම් මල්කරු බිම්බිසාර මහ රජතුමාට දිනපතාම උදයේ සමන් මල් නැලි අටක් සපයයි. ඒ සඳහා රන් කාසි අටක් ලබයි. දිනක් මොහු මල් කූඩද සකසා රජ මාළිගයට යාම සඳහා විදියට පැමිණියේ ය. අප බුදු පියාණන් වහන්සේ මහා සංඝයා පිරිවරා සවනක් ඝන බුදුරැස් විහිදුවමින් පෙලහර පාමින් එදින රජ මාළිගය කරා වඩින අයුරු මල් කරු දුටුවේය. සුමන මල්කරුගේ සිත බුදු පියාණන් ඇතුළු මහා සංඝයා දැක පහන් විය. යමක් පූජා කිරීමට ඇත්නම් හොඳයැයි සිතී ය. ළඟ ඇත්තේ රජ අණින් රජ මාළිගයට ගෙන යන සමන් මල් පමණි. රජ මාළිගයට මල් සැපයීම නොකළහොත් ඔහුට රාජ දඬුවම් ලැබේ. සිරගෙයි ලෑම, කසපහර දීම, හෝ හිස ගසා දැමීම විය හැක. මල්කරු මෙසේ සිතීය. ''දෙන දඬුවමක් දුන්නාවේ. මගේ දිවි පුදා මේ මල් බුදු පියාණන් වහන්සේට පූජා කරමියි'' සිතී ය.

බුදුපියාණන් වහන්සේ වඩින මග ඉදිරියට ගොස් සමන් මල් මිටක් අහසට දැම්මේ ය. එසැණින් මේ මල් බුදු පියාණන් වහන්සේගේ හිසට ඉහළින් වියනක් මෙන් අහසෙහි පිහිටියේ ය. ඒ දැක ඇති වූ සතුටු සිතින් තවත් මල් අහසට විසි කළ හ. එම මල් බුදු පියාණන් වටකොට මල් තිර මෙන් වටේට දිස් වූයේ ය. සුමන මල්කරුගේ සිත සතුටින් පිරී ගියේ ය. යළි යළිත් සිහි කර කර සතුටු විය හැකි පිංකමක් කර ගත් බව සිතී ය. මේ දුටු බො-හෝ දෙනා සාධුකාර දුන්හ.

ඒ හඬ රජ මාළිගයටත් ඇසුණේ ය. රජතුමාද එය විපරම් කර දැන බුදුපියාණන් වහන්සේ රජ මාළිගයට වඩම්මවා දන් පිළිගැන්වූ හ. බුදුපියාණන් වහන්සේ ආපසු වෙහෙරට වැඩ ගඳකිළියට ඇතුළු වන තෙක්ම සමන් මල් වියන එළෙසම පිහිටියේ ය. රජතුමා සුමන මල්කරු ගෙන්වා අද දින මල්ගෙන නොඒම පිළිබඳව නිදහසට කරුණු විමසා සිටියේ ය. සුමන මල්කරු සියලු පුවත් රජතුමාට පවසා දෙන දඬුවමක් දෙන ලෙස ඉල්ලා සිටියේ ය. රජතුමා දඬුවම් දෙන බව පවසා සිටියත්, සිදුවූයේ සුමන මල්කරුට බොහෝ ධනය දී සිටු තනතුරක් ද ප්‍රදානය කිරීම යි.

සුමන මල්කරු දිවි නොතකා මල් පිදූ අනුහසින් මෙලොවම මෙසේ මහත් දේ හිමි වූයේ ය. ඒ මල් පිදුම නිසා අද පුදුම දේ සිදුවිණ යි බුදුපියාණන් වහන්සේට ආනන්ද හිමියන් සැලකල හ. එවිට බුදුපියාණන් වහන්සේ

''ආනන්ද මොහු ගේ මේ මල් පිදුම සුලු කොට නොතකන්න. ඔහු මල් සමග දිවිත් පිදුයේය. මතු සුමන නමින් පසේ බුදු වන්නේ ය යි පවසා, යමක් කොට නොතැවේ ද එහි විපාකය තුටු පහටු සිතැතිව විඳී ද එබඳු නිවරද දෙය කිරීම යහපතට හේතු වන්නේ ය'' යි වදාළ සේක.

සීයෝ මුහුබුරෝ

''සීයාහ්, දැං කිම් අංකල්ට තියෙන්නෙ අලුත් පාටියක් හදාගන්න නෙහ්.''

''ඒවා පිස්සු වැඩ නේ පුතා ''

''ඒ උනාට කිම්ට කැමැති අයත් හුඟ දෙනෙක් ඉන්නවාණ් සීයෝ''

''ඒ වගේ කඩාකප්පල් වැඩ...''

''එහෙම නැත්තං... ජෝං මහත්තයාට එක්කහු වෙන්න''

''ඒ... ඒක හරි.... අපේ අනුර මහත්තයලා, පීරිස් මහත්තයලා වගේ, ඒ ක්‍රම මෙහේ අය තාම දන්නෑ මයි හිතේ'